පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය
**10**

# අවසාන වාර පරීක්ෂණය - 2022

විෂයය :- පෙරදිග සංගීතය I, II

පාසලේ නම : ..........................................................

ඇතුළත්වීමේ අංකය : ..........................

කාලය : පැය 03 යි.

## I කොටස

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න**
- **අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (i), (ii), (iii), (iv) පිළිතුරු අතුරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.**

(01) බිලාවල් රාගයට අදාළ නිවැරදි ප්‍රකාශය වන්නේ,

i. වාදී සංවාදී ලෙස ගාන්ධාරය හා නිෂාදය යෙදීම.

ii. සම්පූර්ණ ජාතියට අයත්, ශුද්ධ ස්වර පමණක් යෙදීම.

iii. අවරෝහණයේ නිෂාදය කෝමල වීම.

iv. ඖඩව ජාතියට අයත්, ශුද්ධ ස්වර පමණක් යෙදීම.

(02) විවාදී ස්වර වශයෙන් ස්වර පහක් යොදාගත හැකි රාගය වන්නේ,

i. භෛරවී ii. කාෆි iii. බිලාවල් iv. භූපාලි

(03) රි නි ධ නි ප ධ ම ප, රි ගු රි ම ගු රි ස, යන ස්වර සංගතිය අයත් රාගය කුමක් ද?

i. යමන් ii. කාෆි iii. භූපාලි iv. බිලාවල්

(04) එක ම ථාටයට අයත් රාග යුගලය වන්නේ,

i. කාෆි - බිලාවල් ii. භෛරවි- යමන් iii. භූපාලි - යමන් iv. බිලාවල් - භූපාලි

(05) ස රි ග, රි ග ප, ග ප ධ, - - - යන ස්වර අභ්‍යාසයේ භූපාලි රාගයට අදාළ ව ඊළඟ පියවර වන්නේ,

i. ප ධ ස් ii. ම ධ නි iii. ම ධ ස් iv. ප නි ස්

(06) ''ධ ස්වර වාදී ග සංවාදී''
''ග ස්වර වාදී ධ සංවාදී''

ඉහත ගී පාද දෙකෙන් ප්‍රකාශ වන රාග යුගලය පිළිවෙළින් නම් කරන්න.

i. යමන් - භූපාලි ii. බිලාවල් - භූපාලි iii. භූපාලි - බිලාවල් iv. භෛරවි - යමන්

(07) ස්වර මාලිකා ලෙස හඳුන්වන්නේ,

i. මධ්‍යලය ගීත වේ. iii. ලක්ෂණ ගීත වේ.

ii. ස්වර අභ්‍යාස වේ. iv. සර්ගම් වේ.

(08) සප්තකයේ ස්වර දොළොස තීව්‍ර, කෝමල, ශුද්ධ ලෙස වර්ග කළ විට ලැබෙන සංඛ්‍යා පිළිවෙළින්,

i. 7, 4, 1 වේ. ii. 6, 5, 1 වේ. iii. 1, 4, 7 වේ. iv. 4, 6, 2 වේ.

(09) ''ඇසේ මතුවන කඳුළු බිඳුගෙන'' යන ගී පාදය සඳහා වාදනය කිරීමට සුදුසු රිද්ම රටාවක් වන්නේ,

i. |x x x | x x x | iii. |x x x| x x x x| x x x| x x x x|

ii. |x x| x x x| x x| x x x| iv. |x x x x| x x x x|

(10) නව වෙනි මාත්‍රාවේ බලිය යෙදෙන හින්දුස්ථානි තාලය වන්නේ,

i. ජප් ii. ත්‍රිතාල් iii. දීප්චන්දි iv. කෙහෙර්වා

(11) රාගයක වාදී ස්වරය හඳුන්වන තවත් නමක් වන්නේ,

i. සතුරු ස්වරය ii. ජීව ස්වරය iii. ආගන්තුක ස්වරය iv. වර්ජ්‍ය ස්වරය

(12) යේකාව සමාන වුවත් විභාග ගණන අසමාන වන නිර්දේශිත තාල යුගලය වන්නේ,

i. ත්‍රිතාල් - ලාවනී  iii. ලාවනී - කෙහෙර්වා

ii. දාදාරා - කෙහෙර්වා  iv. ත්‍රිතාල් - කෙහෙර්වා

(13) ව්‍යවහාරික සංගිතයේ 3/4 සහ 6/8 යන රිද්ම රටාවන්ට ගැළපෙන හින්දුස්ථානී තාල වන්නේ පිළිවෙළින්,

i. දීප්චන්දි - බෙම්ටෝ  iii. ජප්තාල් - දාදරා

ii. දාදරා - බෙම්ටෝ  iv. ත්‍රිතාල් - කෙහෙර්වා

(14) තාලයක පළමු මාත්‍රාවේ සිට අවසාන මාත්‍රාව දක්වා මාත්‍රා පරාසය හඳුන්වනු ලබන්නේ,

i. යේකාව නමිනි  iii. ආවර්ත නමිනි

ii. විරිත නමිනි  iv. මාත්‍රා නමිනි

(15) |දොං |ජිංත |ගත |දොංත | නිවැරදි ප්‍රකාශය තෝරන්න.

i. මෙය මැදුම් මහ දෙතිතයි  iii. මෙය සුළු මහ දෙතිතයි

ii. මෙය සුළු මැදුම් දෙතිතයි  iv. මෙය මහ තනිතිතයි

(16) අනාඝාතාත්මක මෙහෙ ගී වර්ගයක් නොවන්නේ,

i. ගැල් ගී  ii. ගොයම් ගී  iii. පතල් ගී  iv. පාරු ගී

(17) ''සීත ගඟුලේ දී ඇඟ පේවෙනවා'' යන ගීතය,

i. නැළවිලි ගීයකි  iii. තුන්සරණේ ගීයකි

ii. ශාන්තිකර්ම ගීයකි  iv. රබන් ගීයකි

(18) වෙස්සන්තර කාව්‍යයේ එන වැලපුම් ගී නාද රටාව අනුසාරයෙන් නිර්මිත ගීතයකි.

i. දුනුකෙයියා මලක් වගේ  iii. කඳුළු හෙළා නෑඹිලියට

ii. සොම්නස හෝ සන්තාපය  iv. මිහිමඩලේ අඳුරු කුසේ

(19) කෙත හා බැඳුණු මෙහෙ ගී පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

i. ගැල්, පැල්, ගොයම්  iii. පැල්, ගොයම්, පාරු

ii. ගොයම්, නෙළුම්, පැල්  iv. ගැල්, කමත්, නෙළුම්

- **අංක 20 සිට 22 තෙක් පහත ගී පාද ඇසුරින් පිළිතුරු සපයන්න.**

A. මහ බෝධි මුලේ විදුරසුනේ......

B. මුනි නන්දන සිරිපාද වඳිම්......

C. බැස සීතල ගඟුලේ පීන පීන......

(20) ග්‍රැමෆෝන් ගීත යුගයේ ගී වර්ග කිරීම අනුව ඉහත ABC ගීත නම් කළ හැක්කේ කෙසේද?

i. A ස්වාධීන තනු ඇතුළත් ගීත, B රාගධාරී සංගීතය ඇතුළත් ගීත, C අනුකාරක ගීත.

ii. A රාගධාරී සංගීතය ඇතුළත් ගීත, B අනුකාරක ගීත, C ස්වාධීන ගීත.

iii. A අනුකාරක ගීත, B රාගධාරී සංගීතය ඇතුළත් ගීත, C ස්වාධින තනු ඇතුළත් ගීත

iv. A බුදුගුණ ගීත, B තුන්සරණේ ගීත, C සමාජ ගීත

(21) C ගීතයට අදාළ ගීත ආර ජනප්‍රිය කිරීමට පුරෝගාමී වූ සංගීතඥයෙකු වන්නේ,

i. එච්.ඩබ්.රූපසිංහ  iii. බී.එස්.පෙරේරා

ii. ආනන්ද සමරකෝන්  iv. ඇනී බොතේජු

(22) A, B, C යන ගීත තුන ගායනයට උචිත හින්දුස්ථානී තාලය වන්නේ,

i. ත්‍රිතාල් ii. කෙහෙර්වා iii. බෙම්ටෝ iv. දාදරා

(23) සරල ගීයක් විචිත්‍ර කිරීම සඳහා උපයෝගී කරගන්නා සංගීතමය අංග දෙකක් වන්නේ,

i. Chorus - Verse (කෝරස් - වර්ස්)

ii. Bits - Counter point (බිට්ස් - කවුන්ටර් පොයින්ට්)

iii. Verse - Bits (වර්ස් - බිට්ස්)

iv. Chorus - Bits (කෝරස් - බිට්ස්)

(24) එදිරිවීර සරච්චන්ද්‍ර මහතාගේ ''සිංහබාහු'' නාට්‍යයේ ගීතයක් නොවන්නේ,

i. වගුරට නරනිඳු ii. දුලා නෙතු පුලා iii. ගල්ලෙන බිඳලා iv. බුදු තුල් ගුණැති

(25) කර්ණාටක සංගීත ආභාසය ලත් රංග ශෛලියකි,

i. නාඩගම් ii. කෝළම් iii. සොකරි iv. නූර්ති

- **ප්‍රශ්න අංක 26-29 තෙක් ඇති ප්‍රශ්නවලට පහත රූපසටහන ඇසුරෙන් පිළිතුරු සපයන්න.**



A B C D

(26) ''උස්තාද් ශකීර් හුසේන්'' ප්‍රවීණත්වයක් දරන සංගීත භාණ්ඩයට අදාළ අක්ෂරය,

i. A ii. B iii. C iv. D

(27) C අක්ෂරයෙන් දැක්වෙන භාණ්ඩය සඳහා ප්‍රවීණත්වය දරූ සංගීතඥයෙකි,

i. ජග්ජිත් සිං iii. ශකීර් හුසේන්

ii. හරිප්‍රසාද් චෞරසියා iv. රවි ශංකර්

(28) භාරතයේ ශාන්ති නිකේතනයේ ප්‍රචලිත වූ සංගීත භාණ්ඩයට අදාළ අක්ෂරය

i. A ii. B iii. C iv. D

(29) පණ්ඩිත් රවිශංකර් මහතා හා සම්බන්ධ සංගීත භාණ්ඩයට අදාළ අක්ෂරය

i. A ii. B iii. C iv. D

(30) ඉන්දියානු සිනමා සංගීතය සම්බන්ධ සම්මානලාභී නව පරපුරේ සංගීතඥයකු වන්නේ,

i. ඒ.ආර්.රහුමාන් ii. ආර්.ඩී.බමර්න් iii. ජග්ජිත් සිං iv. යානි

(31)

A- හෙළ | ජාsතික | අභිමාs | නේsss |s s s s|

B- |සසර | වසන | තුරුs | sss |

C- |හාss රිච්චි |බෝss රිච්චි | කම්බි කුsරු | බෝsල මාsල |

D- සු | නිල් | වන්නු | වන් | යුගව | සාs | උතුර | උතු | රාs ගැ|

ඉහත සඳහන් ගී පද ප්‍රස්තාර අතුරෙන් විෂම ග්‍රහයෙන් පද ප්‍රස්තාර කර ඇති ගී පාද වන්නේ,


i. A සහ B ය. ii. A සහ D ය. iii. B සහ C ය. iv. C සහ D ය.

.


(32) ම ධ ස් ස්වර තුන එකවර වැයීමේ දී නිකුත් වන කෝඩ් (Chord) එක වන්නේ,

i. G මේජර් ය. ii. F මේජර් ය. iii. D මේජර් ය. iv. C මේජර් ය.

(33) පහත A හා B රූප සටහන් සලකන්න.



A රූප සටහන



B රූප සටහන

ඉහත A රූප සටහනේ ස්වරයට වඩා B රූප සටහනේ ස්වරය,

i. තාරතාවයෙන් වැඩි ය.
ii. තාරතාවයෙන් අඩු ය.
iii. විපුලතාවයෙන් වැඩි ය.
iv. විපුලතාවයෙන් අඩු ය.

(34) සමූහ වාදනයක දී වයලීනය, සිතාරය, එස්රාජය, බටනලාව ආදී සංගීත භාණ්ඩවල හඬ වෙන් කොට හඳුනාගත හැකි නාදයේ ගුණය වන්නේ,

i. විපුලතාවය
ii. තාරතාවය
iii. ධ්වනි ගුණය
iv. හඬේ සැර

(35) උච්ඡ සඩ්ජය, මධ්‍ය සඩ්ජය, මන්ද්‍ර සඩ්ජය යන ස්වරයන්ගේ කම්පන සංඛ්‍යාතයන් පිළිවෙළින් දක්වා ඇති පිළිතුර තෝරන්න.

i. 256 Hz, 512 Hz, 128 Hz
ii. 512 Hz, 384 Hz, 256 Hz
iii. 480Hz, 384 Hz, 256 Hz
iv. 512 Hz, 256 Hz, 128 Hz

(36) එක් අතකින් Chords වාදනය කරමින් අනෙක් අතින් Melody වාදනය කළ හැකි සංගීත භාණ්ඩ දෙකක් සඳහන් පිළිතුර වන්නේ,

i. ගිටාරය සහ විදුලි ඕර්ගනය
ii. විදුලි ඕර්ගනය සහ එකෝඩියනය
iii. ඔක්ටපෑඩය සහ ගිටාරය
iv. විදුලි ඕර්ගනය සහ ඔක්ටපෑඩය

(37) කණ්ඩායම් සංගීතය සඳහා යොදා ගනු ලබන සංගීත භාණ්ඩ පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,

i. එකෝඩියන්, ගිටාර්, බේස් ඩ්‍රම්, ටැම්බරින්, කොංගෝ
ii. ටැම්බරින්, කොංගෝ, සින්තසයිසර්, ගිටාර්, සයිඩ් ඩ්‍රම්
iii. ගිටාර්, එකෝඩියන්, ටැම්බරින්, සිම්බල්, කොංගෝ
iv. කොංගෝ, ටැම්බරින්, එකෝඩියන්, ගිටාර්

(38) 'තූ ගංගා කි මෞජ මෛ'' ගීතය අයත් හින්දි චිත්‍රපටය,

i. බෛයිජුබව්රා
ii. ජනක් ජනක් පායල භාජේ
iii. මධුමතී
iv. අභිමාන්

(39) නූතන යතුරු පුවරුවලින් විවිධ සංගීත භාණ්ඩවල හඬ සාම්ප්‍රදායික භාණ්ඩවලින් තොරව විද්‍යුත් ක්‍රමයකට සැකසීම,

i. Sound fonts ii. MIDI iii. Britannica iv. Wikipedia

(40) හඬ ග්‍රහණය කරගන්නා තාක්ෂණික උපකරණයකි.

i. මික්සර්
ii. ඇම්ප් (අම්ප්ලිෆයර්)
iii. මයික්‍රෆෝන්
iv. බෆල්

## II කොටස

- **පළමුවන ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

**(01) අංක (i) සිට (v) තෙක් අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ප්‍රශ්න අංකය ද සමගින් ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.**

(i) සර්ව කාලීන රාගයක් ලෙස සැලකෙන නිර්දේශිත රාගය කුමක් ද?

(ii) තීව්‍ර මධ්‍යමය යොදා ගන්නා නිර්දේශිත රාගයෙහි ජාතිය නම් කරන්න.

(iii) තාල සංඥා ලෙස X, O පමණක් යෙදෙන හින්දුස්ථානී තාලයක් නම් කරන්න.

(iv) ඩබ්.බී.මකුලොලුව මහතා විසින් රචිත ජන සංගීත කෘතිය කුමක් ද?

(v) කවි පන්තියක් ගීතයක් ලෙසට ප්‍රතිනිර්මාණය කරන ලද අවස්ථාවකට උදාහරණ ගීතයක් නම් කරන්න.

- **අංක (vi) සිට (viii) තෙක් හිස්තැන් සඳහා නිවැරදි පිළිතුරු ප්‍රශ්න අංකය ද සමග ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.**

(vi) ''දෑතට වළලු මල් මුතුවැල් මාල පොටයි'' යන ගීතයේ පද මාලාව සහ තනුව නිර්මාණය කරන ලද්දේ ................................ මහතා විසිනි.

(vii) ................................මහතා මල්සරා බැල්ම හෙළා ගීතය ගායනා කරයි.

(viii) ලයනල් රංවල මහතාගේ නිර්මාණ ඇතුළත් ජන සංගීත කණ්ඩායම ...............……… නම් වේ.

- **ප්‍රශ්න අංක (ix) සිට (xii) දක්වා පිළිතුරු සැපයීමට වරහන් තුළ ඇති පිළිතුරු උපයෝගී කර ගන්න.**

(අටවිසිමත් පැදි, සමුද්‍රඝෝෂ, සොළොස්මත්, දොළොස්මත්)

| | **ගී පාදය** | **විරිත** |
|---|---|---|
| (ix) | පැහැසරණිය මිණි පැමිණිය කොත් අගට | |
| (x) | රූ රැසේ අඳිනා ලෙසේ අත් ලෙල දිදී විදුලිය පබා | |
| (xi) | සඳවා සුදු වැලි පිවිතුරු | |
| (xii) | මනමත් කරවන දන මුළු දෙරණා | |

(02) නිර්දේශිත රාග දෙකකට අයත් තාලානුකූල ප්‍රස්තාර කොටස් දෙකක් පහත දැක්වේ.

A. |නි̣ ස ග | ම ප ධ - | ග ප ම | රි රි ස - |

B. |නි̣ රි | ග - ප | රි - | නි̣ රි ස|

i. A සහ B ප්‍රස්තාර කොටස් අයත් වන රාග පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 02 යි)

ii. ඉහත රාග දෙකෙන් එකක මධ්‍යලය ගීතයක හෝ ලක්ෂණ ගීතයක ස්ථායි කොටස ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 04 යි)


iii. A සහ B ප්‍රස්තාර සඳහා වාදනය කිරීමට සුදුසු හින්දුස්ථානී තාල දෙක නම් කරන්න. (ලකුණු 02 යි)

iv. A සහ B රාග දෙකට අදාළව පහත තොරතුරු සම්පූර්ණ කරන්න.

| රාගය | මුඛ්‍යාංගය | ථාටය |
|---|---|---|
| A | | |
| B | | |

(ලකුණු 04 යි)

(03) තබ්ලාවෙන් උත්පාදනය කර ගත හැකි අවනද්ධ අක්ෂර කිහිපයක් පහත රූප සටහනෙහි ඇතුළත් කර ඇත.




(i) ඉහත රූප සටහනෙහි අඩංගු අවනද්ධ අක්ෂර පහත පරිදි වර්ග කරන්න.

A. බායාවෙන් උපදින අක්ෂර


B. දායාවෙන් උපදින අක්ෂර

C. බායාව සහ දායාව යන කොටස් දෙකෙන්ම උපදින අක්ෂර (ලකුණු 04 යි)

(ii) තබ්ලා මුහුණතක දළ රූප සටහනක් ඇඳ එහි **ධ, ති, ගෙ** යන අක්ෂර නිකුත් වන ස්ථාන සලකුණු කරන්න. (ලකුණු 06 යි)

(iii) දෙස් - විදෙස් තබ්ලා වාදකයින් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02 යි)

(04) පහත දැක්වෙන්නේ ශ්‍රී ලංකාවේ ජන ගී වර්ගීකරණය පිළිබඳ අසම්පූර්ණ ගැලීම් සටහනකි.




(i) ඉහත ගැලීම් සටහනෙහි ඇති හිස්තැන්වලට අදාළ පිළිතුරු රෝම ඉලක්කම් ද සමගින් ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න. (ලකුණු 04 යි)

(ii) ගැමි ගී නිර්මාණය වීම කෙරෙහි බලපා ඇති හේතු සාධක තුන විස්තර කරන්න. (ලකුණු 03 යි)

(iii) ආසාතාත්මක ගැමි ගී සහ අනාසාතාත්මක ගැමි ගී යන්න උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(05) ශ්‍රී ලංකාවේ ප්‍රචලිත නව නාට්‍ය තුනක ඡායාරූප පහත දක්වේ.



A



B



C

(i) A, B, C නාට්‍ය තුන පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) ඉහත නාට්‍ය සඳහා ආභාසය ලබා ඇති සාම්ප්‍රදායික නාට්‍ය ශෛලියෙහි සංගීතමය ලක්ෂණ 4 ක් ලියන්න. (ලකුණු 04 යි)

(iii) A සහ C නාට්‍ය දෙකෙහි ඇතුළත් පහත ගීත සඳහා ඇසුරු කර ගන්නා ලද සාම්ප්‍රදායික ගීත 2 නම් කරන්න.

A නාට්‍යය - බුදු තුල් ගුණැති සමිඳුනේ

B නාට්‍යය - මෑ වේ මා දුටු කොමල ලියා (ලකුණු 02 යි)

(iv) ABC නාට්‍ය තුන සඳහා ම වාදනය කර ඇති අවනද්ධ භාණ්ඩය නම් කර එම භාණ්ඩය පිළිබඳ කරුණු 02ක් ලියන්න. (ලකුණු 03යි)

(06) ව්‍යවහාරික සංගීතාංග කිහිපයක තොරතුරු පහත දක්වේ.

A- පෘතුගීසි පාලන සමයේ මෙරට ව්‍යාප්ත වූ සංගීතාංගයකි.

B- 1901 දී පමණ මෙරටට ලැබුණු තාක්ෂණයක් සමග ක්‍රමයෙන් ජනප්‍රිය විය.

C- 1925 දී මෙම තාක්‍ෂණය ශ්‍රී ලංකාවට ලැබුණු අතර ආනන්ද සමරකෝන් සහ සුනිල් සාන්ත යන දෙපල මෙහි පුරෝගාමීන් විය.

(i) A, B, C සංගීතාංග පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) A ගීත විශේෂයෙහි සංගීතමය ලක්ෂණ 3 ක් විස්තර කරන්න. (ලකුණු 03 යි)

(iii) B ගීත විශේෂය හා සම්බන්ධ ගායක ගායිකාවන් දෙදෙනෙකු හා ඔවුන් ගායනා කළ ගීත 02 ක් නම් කරන්න. (ලකුණු 04 යි)

(iv) ආනන්ද සමරකෝන් හෝ සුනිල් සාන්ත යන එක් සංගීතඥයකු විසින් නිර්මාණය කරන ලද සරල ගීත 02 ක් නම් කරන්න. (ලකුණු 02 යි)

(07) බටහිර සංගීත ස්වර ප්‍රස්තාරයක කොටසක් පහත දැක්වේ.





(i) ඉහත බටහිර සංගීත ප්‍රස්තාරය පෙරදිග සංගීත ක්‍රමයට පෙරළා ප්‍රස්තාර කරන්න.

(ලකුණු 04 යි)

(ii) එම ප්‍රස්තාරයේ A B C D සංකේත නම් කරන්න. (ලකුණු 04යි)

(iii) ව්‍යවහාරික සංගීතය තුළ ස්වර ලිපියක යොදාගන්නා පහත සංකේත හඳුන්වා ඒවායේ අදහස පැහැදිලි කරන්න.

(අ) 

(ආ) 

(ලකුණු 04 යි)